# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1988 අංක 82 දරන
# ගුවන් හමුදා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 20 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 30 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 82 දරන ගුවන් හමුදා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 39/87

**ගුවන් හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 82 දරන ගුවන් හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගුවන් හමුදා පනතේ 40 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 359 වන අධිකාරයේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) කෝප්‍රල්වරයකු හැර, අධිකාර නොලත් නිලධරයකු මේ පනතේ දක්වා ඇති යම් වරදකට චෝදනා කරනු ලැබ සිටින අවස්ථාවක, චූදිතයා වරදකරු කරනු ලැබූ විට දඬුවම, වැටුප අහිමිකිරීමක් අදාළ වන්නේ නම් හෝ තත් කාර්ය සඳහා සාදන ලද නියෝග මගින් අණ දෙන නිලධරයකුට පැනවීමට බලය දී තිබෙන සුළු දඬුවමකින් පමණක් සමන්විත වන්නේ නම් චූදිතයාගේ අණ දෙන නිලධරයා විසින්, ඔහු සම්බන්ධයෙන් ලඝු ආකාරයෙන් කටයුතු කරනු ලැබීමට කැමැත්තෙහි ද, එසේ නැත්නම්, යුද්ධාධිකරණයක් මගින් විභාග කරනු ලැබීමට කැමැත්තෙහි ද යන වග චූදිතයාගෙන් විමසනු ලැබිය යුතුය. තවද යුද්ධාධිකරණයක් මගින් විභාග කරනු ලැබීමට චූදිතයා කැමැත්ත දක්වන්නේ නම් යුද්ධාධිකරණයක් මගින් චූදිතයා නඩු විභාග කරනු ලැබීම පිණිස ඔහු පිය වර ගත යුතු ය. එසේ නැතහොත්, චූදිතයා ඒ සම්බන්ධයෙන් එසේ කැමැත්ත නොදක්වන්නේ නම් චූදිතයා සම්බන්ධයෙන් ලඝු ආකාරයෙන් කටයුතු කර ගෙන යා යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (අ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) (i) අණදෙන නිලධරයා, අංශ අණදෙන නිලධරයකුගේ නිලය හෝ ඊට ඉහළ නිලයක් හෝ දරයි නම්, චූදිතයා දින අනූව කට නොවැඩි කාලයක් රඳවා තබා ගැනීමට හෝ බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ නියම කරනු ලැබිය යුතු අතර, එවැනි බන්ධනාගාරගත කිරීමේ නියමයක්, ගුවන් හමුදාධිපතිවරයා විසින් ස්ථිර කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතු ය.

(ii) අණ දෙන නිලධරයා, අංශ අණ දෙන නිලධරයකුගේ නිල යට අඩු නිලයක් දරයි නම්, දින විසි අටකට නොවැඩි කාලයක් සඳහා චූදිතයා රඳවා තබාගන්නා ලෙස නියම කරනු ලැබිය යුතු ය; හෝ".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.